# පූර්ව පරීක්ෂණ - 04

ක්‍රිෂාන්ත කුමාර

01. 1. නැම සමාජයක් තේරීම පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ ඇයි.?
2. පහත ප්‍රස්තාර සටහන පිරික්සීමෙන් ලබාගත හැකි නිගමන කවරේද.?
3. ශ්‍රී ලංකාවේ සේවා නියුක්ති මූලයන් දක්වන්න?
4. හි- කමට මුහුණදෙන ආකාරය අනුව ආර්ථික පද්ධති වර්ග කරන ආකාරය සඳහාන් කරන්න.?
5. හි- කම හා අරපිරිමැස්ම එකම සංකල්පයක්ද.?




02. 1. "පසුගිය කාලය තුල ඇතිවූ අධික වර්ෂාපතනය නිසා **කුඩ** ඉල්ලුම් ප්‍රමානයේ වැඩිවීමක් වාර්තා විය." ඉහත ප්‍රකාශය හා එකග වන්නේද? නැද්ද? යන්න හේතු සහිතව පැහැදිලි කරන්න.
2. Qd=60-2P ලෙස ඉල්ලුම් සමීකරණය දී ඇති නම් පාරිභෝගික මුදල් සහනාධාරයක් නිසා ඉල්ලුම් වක්‍රයට සිදුවූ බලපෑම ගනනය කරන්න. (සහනාධාරය ඒකකයට රු. 5ක් විය).
3. Qd=40-2p ලෙස ඉල්ලුම් සමීකරණය දී ඇතිනම් ඒකක පාරිභෝගික මුදල් සහනාධාරය නිසා ඉල්ලුම් සමීකරණය Qd=60-2P ලෙස සඳහාන් විය. ඒ අනුව ඒකක මුදල් සහනාධාරය කොපමනද?
4. P=40-2Qd ලෙස ඉල්ලුම් වක්‍රය දී ඇතිවිට මිල රු,10 දි හා රු,15 දී ඉල්ලුමේ මිල නම්‍යතාවය ගනනය කරන්න.
5. ඉහත සඳහාන් ඉල්ලුම් වක්‍රයට අනුව ඉල්ලුමේ මිල නම්‍යතා සංගුනකය 1 වන මිල කොපමනද?

03. 1. ව්‍යාපාර ආයතනක කෙ□කාලීන පිරිවැය හා දිගුකාලීන පිරිවැය අතර වෙනස කවරේද?
2. ආර්ථික ලාභය යනු කුමක්ද? ආර්ථික ලාභ ඉපයීමට බලපාන සාධක කවරේද.
3. මිල විශේෂනය සඵල වීමට අවශ්‍ය කොන්දේසි මොනවාද?
4. කිරි පි□නිෂ්පාදකයින් රූපවාහිනියේ වෙළඳ දැන්වීම් ප්‍රචාරනය කරන නමුත් එලකිරි නිෂ්පාදකයින් එසේ නොකරති. හේතු පැහැදිලි කරන්න?
5. හීනවන ඵල නීතිය නිර්වචනය කර උදාහරනයක් මගින් පැහැදිලි කරන්න.

04. 1. "ගුනක ප්‍රතිවිපාක" යන්නෙන් කුමක් අදහස් වේද?
2. සමහාර ඉල්ලුම (E) සහා සමහාර සැපයුම (Y) යන සංකල්ප හඳුන්වා Y=E යන්න සමතුලිත කොන්දේසියක් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.
3. දල ජාතික ආදායම එරට දල ජාතික නිෂ්පාදනයට සමාන වේ. එකගවිය හැකිද ? පැහැදිලි කරන්න.
4. ආවෘත ආර්ථික ක්‍රමයක පරිභෝජන ශ්‍රිතය C=100+0.8Y, ලෙසත්,ආයෝජනය I=50 ලෙසත්, සලකන්න.
(අ). මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම කොපමනද?
(ආ). සමතුලිත අවස්ථාවේ දී ආර්ථිකයේ ඉතුරුම් මට්ටම කොපමනද?
(ඇ). ආයෝජනය 100 දක්වා වැඩිවුවහොත් සමතුලිත ආදායම් මට්ටම කෙරෙහි ඇතිවන බලපෑම කවරේද?

05. 1. ඒකාබද්ධ මුදල් සැපයුම යන්නෙහි අර්ථය පැහැදිලි කොට එයට අයත් සංරචක නම් කරන්න.?
2. ඒකාබද්ධ මුදල් සැපයුම තීරණය කරන සාධක මොනවාද?
3. උද්ධමනය පාලනය කිරීම සඳහා යෝජිත ප්‍රතිපත්ති මොනවාද?
4. උද්ධමනය, අවධමනය, නිරුද්ධමනය, මතුපිට උද්ධමනය, මූලික උද්ධමනය යන සංකල්ප පැහැදිලි කරන්න?.
5. උද්ධමන පරතරය යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න?

06. 1. සාපේක්ෂ වාසිය හා නිරපේක්ෂ වාසිය අතර වෙනස පැහැදිලි කරන්න?
2. ජාත්‍යන්තර වෙළඳාම සඳහා නිරපේක්ෂ වාසිය අවශ්‍යම කොන්දේසියක් නොවේ. සංඛ්‍යා ඇසුරින් පැහැදිලි කරන්න?
3. සාපේක්ෂ වාසිය න්‍යාය බිහිවීමට ඉවහල් වන සාධක මොනවාද?
4. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යහයේ දක්නට ලැබෙන වෙනස්කම් මොනවාද?
5. ව්‍යවස්ථාපිත බදු ආපාතය හා ආර්ථික බදු ආපාතය අතර වෙනස දක්වන්න?

**නිසැක "A" සාමාර්තයක් සඳහා මාගේ සුභ පැතුම්**

අපේ ECON වසන්තය

krishantha